ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: **dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය: **www.cbsl.gov.lk**

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2019 දෙසැම්බර් 16 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2019 නොවැම්බර්

2019 නොවැම්බර් මාසයේ දී නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වර්ධනයක් පෙන්නුම් කරමින්, දර්ශක අගය 56.0 ක් ලෙස වාර්තා වූ අතර, නව ඇණවුම්, නිෂ්පාදන සහ සේවා නියුක්තියෙහි සිදුවූ වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය.


**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**56.0**

**2019 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.6 ක පහළ යාමකි.**

නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක 2019 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වුවද වර්ධනයක් පෙන්නුම් කරන ලදී. නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශක අඩු වේගයකින් ඉහළ යාම කෙරෙහි රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයන්හි දක්නට ලැබුණු මන්දගාමී වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම දර්ශක වලට සමගාමීව සේවා නියුක්තිය ද අඩු වේගයකින් වර්ධනය විය.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

තවද, නව ඇණවුම් සහ නිෂ්පාදන අඩු වේගයකින් වර්ධනය වුව ද, එළඹෙන නත්තල් හා නව අවුරුදු නිවාඩු සමග ඇතිවිය හැකි සැපයුම් ප්‍රමාදයන් සැලකිල්ලට ගනිමින් ඉදිරි නිෂ්පාදන අවශ්‍යතා සඳහා තොග දැනටමත් මිලදී ගැනීම හේතුවෙන් ගැනුම් තොග ඉහළ වේගයකින් වර්ධනය විය. තවද, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතුණි.

| විචලනය | ඔක්. | නොවැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **57.6** | **56.0** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 59.7 | 57.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 60.2 | 57.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 58.2 | 57.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ගැනුම් තොගය | 54.1 | 55.6 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 50.5 | 50.0 | - | ඉහළ යෑමක සිට නොවෙනස් මට්ටමට ලඟා වීමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2019 නොවැම්බර් මාසයේ දී නොවෙනස් මට්ටමේ පැවති, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය උප දර්ශකය හැර ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි අනෙකුත් සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරමින්, නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්ත වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.5 කින් ඉහළ යමින් 2019 නොවැම්බර් මාසයේදී 50.3 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2019 නොවැම්බර් මාසයේදී, එක්සත් රාජධානිය සහ රුසියාව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි අඩුවීමක් පෙන්නුම් කරන ලද අතර ඉන්දියාව, රුසියාව, චීනය, එක්සත් ජනපදය සහ යුරෝපා කලාපය නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2019 දෙසැම්බර් 13 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

2019 නොවැම්බර් මාසයේ දී සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, මාස 16 කින් වාර්තා වූ ඉහළම අගය වන දර්ශකාංක 57.4 දක්වා ඉහළ ගිය අතර, නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ වර්ධනය ඊට හේතු විය.

උප දර්ශක අතුරින්, ඉහළම වර්ධනය අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශකයෙහි දක්නට ලැබුණු අතර, එය 2015 ජුනි මාසයේ සිට වාර්තා වූ ඉහළම අගය විය. ප්‍රතිචාර දක්වන්නන් විසින් ඉහළ දේශපාලන ස්ථාවරත්වයක් අපේක්ෂා කරන අතර, නව බදු සංශෝධන හේතුවෙන් ඔවුන්ගේ ව්‍යාපාරවල වර්ධනය යහපත් වනු ඇති බව ද සඳහන් කරන ලදී. තවද, ඉදිරියේදී පැමිණෙන සංචාරක සමය, උත්සව සමය සහ නිවාඩු කාලය ව්‍යාපාර ක්‍රියාකාරකම් කෙරෙහි සුභවාදීව බලපානු ඇතැයි අපේක්ෂා කෙරේ.

නව තාක්ෂණික වර්ධනයන් සමඟ ව්‍යාපාර ක්‍රියාකාරකම් ඉහළ ගිය අතර නව ව්‍යාපාර පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය විය. නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා උප අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනය කැපී පෙනුණි.

| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **56.9** | **57.4** | + | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 61.5 | 52.2 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 59.0 | 59.0 | = | සමාන වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 44.0 | 49.4 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 51.6 | 48.1 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 68.2 | 78.1 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


නවාතැන් සැපයීම, තොග සහ සිල්ලර වෙළඳාම සහ අනෙකුත් පෞද්ගලික සේවා යන උප අංශවල සේවා නියුක්තිය ඉහළ ගියද, සේවා අංශයේ සේවා නියුක්ති දර්ශකය අඛණ්ඩව අටවන වරටත් එහි කඩඉම් මට්ටම වන දර්ශකාංක 50.0 ට වඩා අඩු අගයක පැවතුණි. 2019 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව, නොවැම්බර් මාසයේ දී නිම කිරීමට ඇති කාර්යයන් ද පහළ යන ලදී.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**57.4**

**2019 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.5 ක ඉහළ යාමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 නොවැම්බර් මාසයේ දී මාස තුනකින් වාර්තා වූ ඉහළම අගය වන 51.6 දක්වා ඉහළ යන ලදී.

ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය, චීනය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ 2019 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව නොවැම්බර් මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කළ අතර, එක්සත් රාජධානියෙහි සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය මගින් සේවා අංශයෙහි පහළ යෑමක් පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2019 දෙසැම්බර් 13 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන

ගැනුම් තොගය : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය

නිමකිරීමට නියමිත කාර්යයන් : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම්

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.